## මහජන බැංකුව - 2014

2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශන, ලාභ හෝ පාඩු හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මහජන බැංකුවේ (බැංකුව) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන හා බැංකුව සහ එහි පරිපාලිතයන්ගේ (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි සමාගමක් මට සහාය විය. ඒ සමගම බැංකුවේ ශාඛා 40 ක විගණනය සිදුකිරීම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි සමාගම් 40 ක් සහාය වන ලදී. පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයන්හි සාමාජිකයන් විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි සමාගම් විසින් විගණනය කරන ලදී. ශාඛාවලට අදාළ විස්තරාත්මක විගණන වාර්තා 2015 පෙබරවාරි 18 සිට අප්‍රේල් 22 දක්වා කාලය තුළ වරින්වර බැංකුවට ඉදිරිපත් කරන ලදී. එම වාර්තාවල අඩංගු අදහස් දැක්වීම් හා නිරීක්ෂණ කිහිපයක් මෙම වාර්තාවේ සාරාංශ කර දැක්වේ.

1971 අංක 38 දරන මුදල් පනතේ 5(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, 1992 මැයි 14 දිනැති අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයෙහි පළකරන ලද මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නියෝගය පරිදි එකී මුදල් පනතේ II කොටසෙහි ඇතුළත් විධිවිධානවලින් බැංකුව නිදහස් කර ඇත. එසේම අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරන ලදුව, භාණ්ඩාගාර ලේකම් විසින් ඔහුගේ 1992 අප්‍රේල් 10 දිනැති අංක ඊඒ02/බීසී/පීබී/01 දරන චක්‍රලේඛය මගින් දන්වන ලද පරිදි සියළු භාණ්ඩාගාර හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවලින් බැංකුව නිදහස් කර ඇත.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තියට අනුව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය - බැංකුව

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට මහජන බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**මතය - සමූහය**

බැංකුවේ සහ එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 සමූහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, බැංකුවේ පූර්ණ කොටසක් වන දේශීය බැංකු ඒකක හා අක්වෙරළ බැංකු ඒකකයේ මූල්‍ය ප්‍රකාශනවලින් සමන්විත විය. සමූහයේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූලව බැංකුවේ, එහි පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් සමන්විත විය. සී/ස පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 99 ක්ද, පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී හි කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 75 ක්ද, පීපල්ස් මර්චන්ට් බැන්ක් පීඑල්සී හි කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 26.13 ක් හා සී/ස ස්මාර්ට් නෙට් ලංකා (පුද්ගලික) සමාගමේ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට 37.3 ක් ශේෂ පත්‍ර දිනට බැංකුව සතුව තිබුණි.

2014 දෙසැම්බර් 31 දිනට එක් එක් පරිපාලිත සහ ආශ්‍රිත සමාගමෙහි බැංකුව සතු අයිතිය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| | සෘජු ආයෝජන | | | |
|---|---|---|---|---|
| | 2014<br>රු.000 | ප්‍රතිශතය | 2013<br>රු.000 | ප්‍රතිශතය |
| <u>පරිපාලිත සමාගම්වල නම්</u> | | | | |
| සී/ස පීපල්ස් ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම | 4,950 | 99 | 4,950 | 99 |
| පීපල්ස් ලීසින් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 1,040,958 | 75 | 1,240,958 | 75 |
| පරිපාලිත සමාගම්වල මුළු ආයෝජන | 1,045,908 | | 1,245,908 | |
| <u>ආශ්‍රිත සමාගම්වල නම්</u> | | | | |
| පීපල්ස් මර්චන්ට් බැන්ක් පීඑල්සී | 273,100 | 26.13 | 273,100 | 26.13 |
| සී/ස ස්මාර්ට් නෙට් ලංකා (පුද්ගලික) සමාගම | 25,000 | 37.3 | 25,000 | 37.3 |

| | | |
|---|---|---|
| **ආශ්‍රිත සමාගම්වල මුළු ආයෝජන** | **298,100** | **298,100** |
| අඩුකළා - හානිකරණය සඳහා ප්‍රතිපාදන පීපල්ස් මර්චන්ට් බැන්ක් පීඑල්සී | - | (65,532) |
| සී/ස ස්මාර්ට් නෙට් ලංකා (පුද්ගලික) සමාගම | (25,000) | (25,000) |
| **ආශ්‍රිත සමාගම්වල ශුද්ධ ආයෝජනය** | **273,100** | **207,568** |

**2.3 බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.3.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති (ශ්‍රීලගිප්‍ර)**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**ශ්‍රීලගිප්‍ර 39 - මූල්‍ය උපකරණ : මිනුම්කරණය හා හඳුනාගැනීම**

බැංකුව විසින් පරිණතවීම් සඳහා ඇති මූල්‍ය වත්කම් වටිනාකම, සඵලදායී පොලී අනුපාතය (Effective Interest Rate) යොදා ගෙන ක්‍රමක්ෂය කරනු වෙනුවට සරල පොලී අනුපාත ක්‍රමය පදනම් කර ගෙන හඳුනාගෙන තිබුණි. එබැවින් ක්‍රමක්ෂය වටිනාකම හා මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් වටිනාකම අතර රු.5,825,679 ක වෙනසක් විය.

තවද බැංකුව භාණ්ඩාගාර බැඳුම්කර (Treasury Bonds) සඳහා පොලී ආදායම, සඵලදායී පොලී අනුපාතය (Effective Interest Rate) යොදා ගෙන හඳුනා ගනු වෙනුවට සරල පොලී අනුපාතය යොදා ගෙන හඳුනා ගෙන තිබුණි.

**2.3.2 පැහැදිලි නොකළ වෙනස්කම්**

පහත සඳහන් පැහැදිලි නොකළ වෙනස්කම් නිරීක්ෂණය විය.

(අ) උකස් ණය සම්බන්ධයෙන් මහජන බැංකු ස්වයංක්‍රීය බැංකු පද්ධතියේ (People's Automated Banking System) දැක්වෙන මුදල හා පොදු ලෙජරය යටතේ වාර්තා කරන ලද ශේෂය අතර රු.333,065,000 ක පැහැදිලි නොකළ වෙනස්කමක් නිරීක්ෂණය විය.

(ආ) සිල්වර් ලේක් ඉන්ට්‍රිග්‍රේටඩ් බැන්කින් සිස්ටම් ඩේටා වෙයාර් හවුස් (Silver Lake Intergrated Banking System Date ware house) හි වාර්තා කරන ලද ස්ථාවර තැන්පතු හා ඉතිරිකිරීම් ගිණුම් සහ පොදු ලෙජරයේ දැක්වෙන ශේෂ අතර රු.6,542,966 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.3.3 අවිනිශ්චිත ගිණුම්**

අවිනිශ්චිත ගිණුම් 07 ක රු.204,459,968,000 ක මුදලක් 2014 දෙසැම්බර් 31 වන විටත් නිරවුල් කිරීමෙන් තොරව පැවතුණි.

**2.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

බැංකුව විසින් රු.90,300,000 ක පිරිවැයකට කොටස් 9,030,000 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවෙන් 2014 නොවැම්බර් 27 දින මිලදී ගෙන තිබුණි. කෙසේ වුවද ආයෝජන සඳහා වූ කොටස් සහතික කැඳවා තිබුණද පරීක්ෂා කිරීම සඳහා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1961 අංක 29 දරන මහජන බැංකු පනත | බැංකුවේ අනුදත් කොටස් ප්‍රාග්ධනය සාමාන්‍ය කොටස් මිලියන 20 කට සීමා විය. බැංකුව කොටස් 999,960 ක් පමණක් නිකුත් කර තිබුණද විභජනයට නියමිතව ඇති ප්‍රාග්ධනය රු. මිලියන 7,152 වූ අතර, එය පනතේ සඳහන් අනුදත් ප්‍රාග්ධනයද ඉක්මවන කොටස් 143,040,000 ප්‍රමාණයකට සමානය. කෙසේ වුවද, අනුදත් කොටස් ප්‍රාග්ධනය ලෙස ප්‍රාග්ධන විභජනයට නියමිත ගිණුමේ රඳවා ඇති රු.මිලියන 7,152 ක මුදල මහජන බැංකු පනත සංශෝධනය කර තවදුරටත් වැඩි කළ යුතුව ඇත. |
| (ආ) | 2005 අප්‍රේල් 12 දිනැති අංක 02/17/402/0073/001 දරන ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ සංග්‍රහය | ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශ ප්‍රකාරව, 2007 වර්ෂය අවසානය වන විට සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සිය ප්‍රාග්ධනය රු.මිලියන 2,500 දක්වා වැඩි කළ යුතුය. කෙසේ වුවද, අවශ්‍ය ප්‍රාග්ධනයට ළඟා වී නොමැති බැංකු කිහිපයක් සඳහා 2006 වර්ෂය අවසානය වන විට අවම වශයෙන් සියයට 50 ක වර්ධනයක් ලබාගැනීමට හා 2007 වර්ෂය අවසානය වන විට රු.මිලියන 2,500 දක්වා සම්පූර්ණයෙන් ළඟා වීමට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අවසර ලබා දී තිබුණි. එහෙත් බැංකුව අවශ්‍ය ප්‍රාග්ධනයට ළඟා වී නොතිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට පැවති ඌනතාවය රු.මිලියන 2,450 ක් විය. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ සමූහයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය පිළිවෙලින් රු.මිලියන 17,231 ක සහ රු.මිලියන 21,627 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බැංකුවේ සහ සමූහයේ බදු පූර්ව ශුද්ධ ලාභය පිළිවෙලින් රු.මිලියන 10,304 ක් සහ රු.මිලියන 13,412 ක් වූයෙන් බැංකුවේ සහ සමූහයේ මූල්‍ය ප්‍රතිඵලවල පිළිවෙලින් රු.මිලියන 6,927 ක සහ රු.මිලියන 8,215 ක වර්ධනයක් දැක්වුණි. පිළිවෙලින් රු.මිලියන 15,146 කින් හා රු.මිලියන 14,490 කින් බැංකුවේ හා සමූහයේ මූල්‍ය වත්කම් මත හානිකරණ පාඩුව අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

#### 3.2.1 මූල්‍ය ප්‍රතිඵල සාරාංශය

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵල පිළිබඳ විවිධ අදියරවල සාරාංශයක් පහත වගුවෙන් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2014 | | 2013 | |
| | බැංකුව | සමූහය | බැංකුව | සමූහය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| පොලී ආදායම | 84,480 | 104,181 | 110,440 | 129,205 |
| පොලී වියදම | (54,362) | (64,211) | (73,791) | (84,245) |
| ශුද්ධ පොලී ආදායම | 30,118 | 39,970 | 36,649 | 44,960 |
| වෙනත් ආදායම් | 11,776 | 14,338 | 9,880 | 10,616 |
| **මෙහෙයුම් ආදායම** | 41,894 | 54,308 | 46,529 | 55,576 |
| ණය සහ වෙනත් පාඩු සඳහා හානිකරණය | 1,430 | 118 | (13,716) | (14,822) |
| ශුද්ධ මෙහෙයුම් ආදායම | 43,324 | 54,426 | 32,813 | 40,754 |
| මෙහෙයුම් වියදම් | (22,455) | (28,800) | (20,803) | (25,249) |
| **එකතු කළ අගය මත බදුවලට (VAT) පෙර මෙහෙයුම් ලාභය** | 20,869 | 25,626 | 12,010 | 15,505 |
| මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බදු | (3,638) | (3,979) | (1,706) | (2,016) |
| **එකතු කළ අගය මත බදුවලට පසු මෙහෙයුම් ලාභය** | 17,231 | 21,647 | 10,304 | 13,489 |
| ආශ්‍රිත සමාගම්වල ලාභ/(පාඩු) කොටස | - | (20) | - | (77) |
| **බදුවලට පෙර ලාභය** | 17,231 | 21,627 | 10,304 | 13,412 |
| බදු වියදම | (3,012) | (4,674) | (2,816) | (4,248) |
| **වර්ෂය සඳහා ලාභය** | 14,219 | 16,953 | 7,488 | 9,164 |

#### 3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂ 04 ක වැදගත් අනුපාත කිහිපයක් ශ්‍රී ලංකා මහ බැංකු (CBSL) ප්‍රතිමාන සමඟ සසඳා පහත දැක්වේ.

| | | ශ්‍රීලංමබැ. ප්‍රතිමාන | තථ්‍ය ප්‍රතිශතවලින් 2014 | 2013 | 2012 | 2011 | 2010 |
|---|---|---|---|---|---|---|---|
| (අ) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (පෙළ I) | 5.00 | 10.9 | 10.4 | 9.8 | 9.6 | 7.9 |
| (ආ) | ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (පෙළ I + පෙළ 2) | 10.00 | 14.3 | 15.0 | 14.0 | 14.5 | 12.8 |
| (ඇ) | වත්කම් මත ප්‍රතිලාභය | - | 1.8 | 1.1 | 2.0 | 2.6 | 1.7 |
| (ඈ) | මුළු අත්තිකාරම්වලට සක්‍රීය අත්තිකාරම් | - | 3.2 | 5.3 | 2.8 | 3.4 | 5.0 |
| (ඉ) | ද්‍රවශීලතා අනුපාතය | | | | | | |
| | -දේශීය බැංකු ඒකකය | | 30.3 | 25.2 | 21.8 | 21.5 | 23.4 |
| | -විදේශ මුදල් බැංකු ඒකකය | | 21.8 | 22.3 | 21.8 | 24.0 | 22.3 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**ශාඛා කාර්යසාධනය හා ලාභදායිත්වය**

ලබාගත හැකි වූ තොරතුරු අනුව, ශාඛා 346 ක් අතුරින් ශාඛා 291 ක් වියදම යළි වෙන්කිරීමට පෙර රු.මිලියන 10,048 ක මුළු ලාභයක් වාර්තා කිරීමට සමත් වූ අතර ශාඛා 55 ක් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 1,013 ක මුළු පාඩුවක් වාර්තා කර තිබුණි. ඒ අනුව වියදම යළි වෙන්කිරීමට පෙර ශාඛා 346 ක ශුද්ධ ලාභය රු.මිලියන 9,035 ක් වූ අතර ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.මිලියන 10,293 ක් වූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලවල රු.මිලියන 245 ක් හෙවත් සියයට 2 ක අඩුවීමක් දැක්වුණි.

2014 වර්ෂය සඳහා කලාප වශයෙන් ලාභය / (පාඩුව) අනුව, වියදම යළි වෙන්කිරීමෙන් පසු බැංකුව රු.මිලියන 3,168 ක ලාභයක් වාර්තා කර තිබූ අතර, ඉකුත් වර්ෂයේ වියදම යළි වෙන්කිරීමෙන් පසු රු.මිලියන 2,594 ක පාඩුවක් වාර්තා කර තිබූ හෙයින් කලාප වශයෙන් ලාභදායිත්වයේ රු.මිලියන 5,762 ක හෙවත් සියයට 222 ක වැඩිවීමක් දැක්වුණි.

බැංකුවේ කලාප වශයෙන් ශාඛා ජාලය හා 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා එහි ලාභදායිත්වය ඉකුත් වර්ෂය හා සසඳා පහත දැක්වේ.

| කලාපය | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| | ශාඛා සංඛ්‍යාව | ලාභය / ( පාඩුව ) | ශාඛා සංඛ්‍යාව | ලාභය / (පාඩුව) |
| | | රු.මිලියන | | රු.මිලියන |
| මධ්‍යම කලාපය | 43 | 885 | 43 | 851 |

| | | | | |
|---|---|---|---|---|
| නැගෙනහිර කලාපය | 29 | (242) | 29 | 118 |
| උතුරු මැද කලාපය | 27 | 502 | 27 | 282 |
| දකුණු කලාපය | 41 | 845 | 41 | 748 |
| සබරගමුව කලාපය | 32 | 784 | 32 | 833 |
| බටහිර කලාපය I | 58 | 3,425 | 58 | 4,569 |
| බටහිර කලාපය II | 39 | 1,473 | 38 | 1,452 |
| වයඹ කලාපය | 31 | 905 | 31 | 951 |
| උතුරු කලාපය | 21 | (61) | 21 | 39 |
| ඌව කලාපය | 25 | 519 | 25 | 450 |
| **එකතුව** | **346** | **9,035** | **345** | **10,293** |
| අඩු කළා - යළි වෙන්කිරීම් වියදම | | (5,867) | | (12,887) |
| **යළි වෙන්කිරීම් වියදමට පසු ලාභය/( පාඩුව)** | | **3,168** | | **(2,594)** |

**4.2 ණය පරිපාලනය**
**-------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ලියා හරින ලද ණය**
**---------------------**

හිඟ ණය හා අත්තිකාරම්වලට අදාළ ප්‍රාග්ධනය හා පොලිය රු.24,831,237 ක් සමාලෝචිත වර්ෂය තුළදී ලියා හැර තිබුණි.

**(ආ) අක්‍රීය ණය (NPL)**
**------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශාඛා 18 ක එක් වාරිකයක් හෝ ගෙවා නොතිබූ මිලියන 1 කට වැඩි ණය 74 කට අදාළව රු.361,688,737 ක හිඟ ණය ශේෂයන් තිබූ බව නිරීක්ෂණය විය.

(ii) රජය සතු ව්‍යාපාර දෙකක් සඳහා දෙන ලද ණය 2006 වර්ෂයේ සිට අක්‍රීය ණය අංශයේ පැවතුණි. 2014 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ මුදල රු.363,794,287 ක් විය.

(iii) 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන ගනුදෙනුකරුවන් 10 දෙනෙකුගේ පිළිවෙලින් එකතුව රු.6,878,244,564 ක් හා රු.631,248,295 ක් වූ අක්‍රීය ණය හා අයිරාවන් පැවතුණි.

(iv) හිඟ ශේෂ අයකර ගැනීම සඳහා කාලීන හෝ විධිමත් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව පහත සඳහන් ශාඛා විසින් ගනුදෙනුකරුවන්ට ලබාදෙන ලද, එකතුව රු.150,020,348 ක් වූ ණය සහ අයිරා පහසුකම් පසුව අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබූ බව නියැදි විගණන පරීක්ෂණයේදී අනාවරණය විය. 2015 අප්‍රේල් 28 දිනට පැවති මුළු හිඟ ශේෂය රු.241,309,746 ක් විය. විස්තර පහත දැක්වේ.

| ශාඛාව | ලබා දෙන ලද ණය / අයිරා පහසුකම් සංඛ්‍යාව | ලබා දෙන ලද කාල පරිච්ඡේදය | ලබා දෙන ලද මුළු ණය මුදල | 2015 අප්‍රේල් 28 දිනට හිඟ මුදල (ප්‍රාග්ධනය හා පොලිය ඇතුළත්ව ) |
|---|---|---|---|---|
| | | | රු. | රු. |
| රත්මලාන | 09 | 2008 සිට 2012 | 11,258,450 | 26,247,657 |
| කතරගම | 02 | 2004 සිට 2005 | 797,861 | 2,070,419 |
| තලවාකැලේ | 05 | 2006 සිට 2013 | 2,672,474 | 4,576,708 |
| කඩුවෙල | 14 | 2006 සිට 2011 | 33,005,307 | 52,862,432 |
| නිට්ටඹුව | 10 | 2001 සිට 2012 | 15,299,245 | 75,693,824 |
| යක්කල | 12 | 1996 සිට 2013 | 86,987,011 | 79,858,706 |
| **එකතුව** | **52** | | **150,020,348** | **241,309,746** |

(v) පවත්නා ගනුදෙනුකරුවකු විසින් නව ගිණුමක් විවෘත කිරීමට පෙර ගනුදෙනු ඉතිහාසය පිළිබඳව බැංකුව විධිමත්ව ඇගයීම් කළ යුතුය. එසේ වුවද වෙනත් ශාඛාවල පවත්වාගෙන යන ජංගම ගිණුම් පිළිබඳ ඇගයීම් කිරීමෙන් තොරව ගනුදෙනුකරුවෙකු සඳහා 2012 අගෝස්තු 07 දින නව ජංගම ගිණුමක් විවෘත කර තිබුණි. පසුව මෙම ගිණුම් අක්‍රීය ණය වර්ගයට මාරු කර තිබුණි.
විස්තර පහත දැක්වේ.

| | ශාඛාවේ නම | ගිණුම විවෘත කළ දිනය | අක්‍රීය ණය වර්ගයට මාරු කළ දිනය | 2015 ජුලි 27 දිනට අක්‍රීය ණය ශේෂය |
|---|---|---|---|---|
| | | | | රු. |
| * | රත්මලාන | 2002 සැප්තැම්බර් 26 | 2008 නොවැම්බර් 03 | 4,532,583 |
| * | මාතර - උයන්වත්ත | 2007 ජුලි 26 | 2008 අගෝස්තු 04 | 1,768,988 |
| * | ගන්දර | 2006 අප්‍රේල් 26 | 2008 නොවැම්බර් 24 | 32,604 |
| * | ගන්දර | 1999 ජුලි 12 | 2009 පෙබරවාරි 25 | 434,634 |
| | | | | 6,768,809 |

(vi) ශාඛා 04 ක් විසින් අවස්ථා 07 කදී ලබාදෙන ලද එකතුව රු.13,223,802 ක් වූ අත්තිකාරම් පසුව අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර තිබුණු බව නිරීක්ෂණය විය. 2015 මැයි 06 දිනට මුළු හිඟ ශේෂය රු.34,320,954 ක් විය. මෙම අත්තිකාරම් සුරැකුම් ලබා ගැනීමෙන් තොරව අනුමත කර තිබූ බැවින් අත්තිකාරම් අයකර ගැනීම සැක සහිතය.

| ශාඛාවේ නම | ලබාදුන් මුදල | 2015 මැයි 06 දිනට මුළු හිඟ ශේෂය ප්‍රාග්ධනය | පොලී සහ වෙනත් | එකතුව |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. |
| රත්මලාන | 3,160,000 | 3,160,000 | 4,792,941 | 7,952,941 |
| | 2,120,000 | 1,456,037 | 2,502,426 | 3,958,463 |
| | 718,916 | 694,560 | 537,044 | 1,231,604 |
| කඩුවෙල | 680,000 | 648,470 | 227,439 | 875,909 |
| නිට්ටඹුව | 4,585,290 | 4,585,290 | 8,346,838 | 12,932,128 |
| | 1,382,236 | 1,382,236 | 5,101,079 | 6,483,315 |
| යක්කල | 577,360 | 577,360 | 309,234 | 886,594 |
| | 13,223,802 | 12,503,953 | 21,817,001 | 34,320,954 |

**(ඇ) ප්‍රමාණවත් නොවූ උකස් දේපල**

2014 වර්ෂයේ ශාඛා 03 ක් යටතේ ගනුදෙනුකරුවන් 05 දෙනෙකුට අදාළව තක්සේරු කණ්ඩායම විසින් දෙන ලද තක්සේරු වාර්තාව අනුව, උකස් දේපලවල වලංගු විකුණුම් වටිනාකම රු.16,921,600 ක් විය. 2015 මැයි 06 දිනට මුළු හිඟ ශේෂය රු.39,063,606 ක් වූ අතර එය දේපලවල වලංගු විකුණුම් වටිනාකම රු.22,142,006 කින් ඉක්මවා තිබුණි.

2015 මැයි 06 දිනට හිඟ ශේෂය

| ශාඛාව | ණය හා අයිරා සංඛ්‍යාව | ප්‍රාග්ධනය | පොලිය හා වෙනත් ගාස්තු | එකතුව | වලංගු විකුණුම් වටිනාකම | වෙනස |
|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. |
| කඩුවෙල | 02 | 4,217,417 | 3,392,203 | 7,609,620 | 2,100,000 | (5,509,620) |
| | 02 | 3,752,630 | 5,061,979 | 8,814,609 | 7,000,000 | (1,814,609) |
| | 01 | 1,161,112 | 1,039,062 | 2,200,174 | 1,100,000 | (1,100,174) |
| නිට්ටඹුව | 05 | 6,587,326 | 11,524,840 | 18,112,166 | 5,000,000 | (13,112,166) |
| යක්කල | 03 | 1,270,025 | 1,057,012 | 2,327,037 | 1,721,600 | (605,437) |
| එකතුව | | 16,988,510 | 22,075,096 | 39,063,606 | 16,921,600 | (22,142,006) |

**(ඇ) රාජ්‍ය සංස්ථාවලට ණය දීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) රාජ්‍ය සංස්ථාවකට ආනයන පහසුකම් කිහිපයක් බැංකුව විසින් ලබා දී තිබුණු අතර 2014 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂය රු.මිලියන 176,038 ක් විය. මෙය 2014 දෙසැම්බර් 31 දිනට බැංකුව විසින් සපයන ලද මුළු හිඟ ආනයන පහසුකම්වලින් සියයට 63 කින්

නියෝජනය වූ බව නිරීක්ෂණය විය. 2014 දෙසැම්බර් 31 දිනට ණය අනාවරණය පහත පරිදි විය.

| පහසුකම් වර්ගය | 2014 දෙසැම්බර් 31 දිනට සංස්ථාවෙන් ලැබිය යුතු මුදල | 2014 දෙසැම්බර් 31 දිනට මුළු හිඟ ශේෂය | මුළු හිඟයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | % |
| ණයවර ලිපි | 26,248.31 | 57,471.64 | 46 |
| ප්‍රතිග්‍රහණ ලිපි | 29,515.20 | 43,502.80 | 68 |
| විදේශ මුදල් ණය | 120,273.61 | 142,338.59 | 84 |
| බැංකු ඇපකර | 1.05 | 36,863.67 | 0.003 |
| මුළු අනාවරණය | 176,038.17 | 280,176.70 | 63 |

(ii) සංස්ථාවක් වෙනුවෙන් තෝරාගත් මාර්ග කොන්ත්‍රාත්කරුවන්ට ගෙවීම සඳහා වූ භාණ්ඩාගාර වන්දි මත රු.14,585,855,096 ක් හා එජඩො 44,717,825 ක් වූ ණය මුදලක් බැංකුව විසින් අනුමත කර තිබුණි. ඒ අනුව බැංකුව විසින් 2014 ජූලි 23 දක්වා සංස්ථාවේ ගණකාධිකාරී විසින් කරන ලද නිර්දේශය මත පමණක් රු.13,925,559,767 ක් හා එජඩො 39,825,960 ක මුදල කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. කෙසේ වුවද බැංකුව විසින් කොන්ත්‍රාත්කරුවන්ට අරමුදල් වියපැහැදම් කිරීමට පෙර ගිවිසුමකට එළඹීමට හෝ ඉහත ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය ඇගයීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ.

| මාර්ග ව්‍යාපෘතිය | අනුමත කළ මුදල | ලබාදුන් දිනය | ලබාදුන් මුදල | 2015 ජූලි 16 දිනට හිඟ ප්‍රාග්ධනය | 2015 ජූලි 16 දිනට ලැබිය යුතු පොලී සහ දඩ මුදල් | 2015 ජූලි 16 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු.මිලියන | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| කටුවන - අලුපොත්දෙණිය (004-8001-000005263) | 2,328.36 | 2012 මාර්තු 20 | 1,975.36 | 1,839.12 | 81.12 | 1,920.25 |
| නාරම්මල - ගිරිඋල්ල (0048001 – 000005281) | 1,400.00 | 2012 මාර්තු 28 | 1,223.16 | 1,164.82 | 52.01 | 1,216.83 |
| ඉබ්බාගමුව - කුඹුක්ගැටේ (0048001 – 000005325) | 2,861.81 | 2012 අප්‍රේල් 02 | 2,739.47 | 2,620.23 | 117.14 | 2,737.37 |
| අනුරාධපුර - ත්‍රිකුණාමලය (0048001 – 000005343) | 7,995.68 | 2012 අප්‍රේල් 02 | 7,987.57 | 7,654.42 | 465.29 | 8,119.70 |
| එකතුව | 14,585.85 | | 13,925.56 | 13,278.59 | 715.56 | 13,994.15 |
| කොළඹ - කටුනායක අධිවේගී මාර්ගය (0048002 – 000000427) | එජඩො 44.72 | 2014 සැප්තැම්බර් 29 | එජඩො 39.82 | එජඩො 39.82 | එජඩො 1.07 | එජඩො 40.90 |

**(ඉ) සේවක ණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2014 වර්ෂය තුළදී අක්‍රීය සේවක ණය ශේෂය රු.මිලියන 260 සිට රු.මිලියන 336 දක්වා වැඩි වී තිබුණද, එම හිඟ ණය ශේෂ අයකර ගැනීමට කළමනාකරණය විසින් ඵලදායී පියවර ගෙන නොතිබුණි.

(ii) මියගිය, වැඩ තහනම් කරන ලද, සේවයෙන් ඉවත් කරන ලද හා වැටුප් රහිත නිවාඩු මත සිටින සේවකයන්ගෙන් ලැබිය යුතු හිඟ සේවක ණය හා අත්තිකාරම් අයකර ගැනීම සඳහා විධිමත් පරිපාටියක් හඳුන්වා දී නොතිබුණි.

(iii) දැනට බැංකුවේ සේවය කරන කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ලබා දී තිබූ රු.14,544,324 ක් වූ ණය, අක්‍රීය ණය වර්ගයට මාරු කර තිබුණි. කෙසේ වුවද, එම හිඟ ණය ශේෂ අයකර ගැනීම සඳහා සේවක ණය අංශය විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(iv) 2014 ජුලි 31 දිනට සේවක ණය අංශය විසින් පිළියෙල කරන ලද අක්‍රීය ණය උපලේඛනය අනුව, නැවත බඳවාගත් සේවකයන්ට අදාළව (විනය ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව) රු.70,457,707 ක හිඟ ශේෂයක් විය.

(v) උකස් දේපලකින් සුරක්ෂණය නොකරන ලද සේවකයන් 67 දෙනෙකුගේ රු.4,051,844 ක් වූ අක්‍රීය හිඟ ණය ශේෂයන් (ප්‍රාග්ධනය රු.3,637,282 ක් හා පොලිය රු.414,562 ක් ) අයකර ගැනීමෙන් තොරව පැවතුණි. හිඟ ණය ශේෂ අයකර ගැනීමෙන් තොරව විශ්‍රාමික සේවකයන්ට අයත් සියලුම විශ්‍රාම ප්‍රතිලාභ ඔවුන්ට ගෙවා තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(vi) 2013 දෙසැම්බර් 31 දිනට සේවක ණය සඳහා බැංකුව විසින් රු.131,360,666 ක් ප්‍රතිපාදනය කර තිබුණි.

**(ඊ) මුදල් ආන්තික ණය**

මාසික ගෙවීම් පදනම මත ලබා දෙන ලද රු.මිලියන 34.9 ක් වටිනා මුදල් ආන්තික ණය පවත්නා ඇපකර වලින් අයකර ගැනීමෙන් තොරව 2015 පෙබරවාරි 01 දින අක්‍රීය ණය වර්ගයට මාරු කර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර බැංකුවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) විගණන ප්‍රමිතිවලට අනුකූලවීම.
(ආ) ණය පරිපාලනය
(ඇ) නොසැසඳූ වෙනස්කම්
(ඈ) අවිනිශ්චිත ගිණුම්
(ඉ) ශාඛා කාර්යසාධනය හා ලාභදායීත්වය
(ඊ) ස්ථාවර වත්කම් පිළිබඳ පාලනය